බදුල්ල ප්‍රාදේශීය සභාව - 2023

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

බදුල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය  ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට  ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන්  වයාවනය කළ මතයක් පළ කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් 154(6) විගණකාධිපති වාර්තාවේ කර තිබුණු 1.6.1 (අ) (ආ) යන නිර්දේශ හැර අනෙකුත් නිර්දේශ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ රු.244,601 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී උසාවි දඩ බිල්කළ ආදායම රු.12,201,014 ක් වුවද, එය රු.13,214,534 ක් ලෙස මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයට රු.1,013,520 ක් අඩුවෙන් ගෙන තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි උසාවි දඩ සහ මුද්දර ගාස්තු ආදායම රු.18,543,691 ක් වුවද, මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ රු.19,044,803 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වටිනාකම සහ එදිනට ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ශේෂය අතර, රු.120,090 ක වෙනසක් පැවතුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී බදුල්ල මහා නගර සභාවට පරිත්‍යාග ලෙස ලබාදී තිබුණු ආයුර්වේද ඖෂධ තොගයේ වටිනාකම රු.436,150 ක් තොග ගිණුමට බැර කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ රු.28,595,530 ක් ලැබී තිබුණු අතර, එම මුදල් ලැබීම් හා එයින් දරන ලද වියදම් ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | ඉකුත් වර්ෂයේදී විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මඟින් පෙන්වා දුන් අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.996,755 ක් හා මුළු වත්කම් වගකීම් ශේෂ අතර වෙනස රු.531,490 ක් සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් සහ වියදම් ගිණුම් ශේෂ 47 ක පොදු ලෙජරයේ ගිණුම් ශේෂ සහ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් ශේෂ අතර රු.22,682,246 ක වෙනසක් පැවතුණි. | 2024 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගණුදෙනු සිදුවූ වහාම ගිණුම්ගත කර ලෙජර් ශේෂ පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු ලිපිද්‍රව්‍ය, ආයුර්වේද බෙහෙත්, පවිත්‍රකාරක ද්‍රව්‍ය සහ විදුලි අලුත්වැඩියා ද්‍රව්‍ය වල ගැණුම් පිරිවැය පොදු ලෙජරය සහ ගබඩා ලේඛන අතර රු.2,346,348ක වෙනසක් පැවතුණි. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ලෙජරයට සිදු කර තිබුණු රු.13,488,787 ක වටිනාකමක් සහිත සටහන් 17කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේ දී ගිණුම් සැකසීමේ නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | උපයෝගී ලේඛන පදනම් කරගෙන ගිණුම් වලට ගෙන ඒ මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමුච්චිත අරමුදලට, වියදම් ණයහිමියන්ට සහ සේවක ණය ලෙජරයට සටහන් කර තිබුණු රු.1,096,855 ක වටිනාකම සනාථ කර ගැනීමට විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 23 සහ 24 (1) වගන්ති | සභාවට අයත් මංමාවත් ස්ථිර සළකුණු සහ සීමා ලකුණු කර මංමාවත් සහ පටු මාවත්වල නාමලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මාර්ග ලේඛනයට අනුව ගැසට් කරන ලද මාර්ගවල දැන්වීම් පළ කිරීමට ඉදිරි වර්ෂය තුළදී කටයුතු කරන බව. | පනතේ විධිවාධන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104(4) | වාහන 02කට අදාළව සිදුව තිබුණු අනතුරු සම්බන්ධව පූර්ණ පරීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පරීක්ෂණ වාර්තා ලැබුණු පසු පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අනතුරු සිදුවූ වහාම පරීක්ෂණ කටයුතු සිදුකර වගකිව යුත්තන් නිශ්චය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,167,874 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,885,488 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනටමුළු හිඟය | ඇස්තමන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,663,704 | 6,166,294 | 4,016,791 | 2,149,503 | 950,184 | 818,290 | 854,746 | (36,456) |
| (ii) | කුලී | 6,300,000 | 1,910,461 | 1,776,047 | 134,414 | 1,200,000 | 1,489,804 | 1,699,850 | (210,046) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 910,000 | 716,500 | 716,500 | 0 | 585,000 | 585,000 | 500,000 | 85,000 |
| (iv) | වෙනත් | 2,550,000 | - | 585,834 | - | 3,021,520 | 2,664,989 | 2,123,061 | 541,928 |
| | එකතුව | 14,423,704 | 8,793,255 | 7,095,172 | 2,283,917 | 5,756,704 | 5,558,083 | 5,177,657 | 380,426 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 02කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වරිපනම් බදු රු.357,292 ක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි කසළ බදු රු.489,250 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | හිඟහිටි කසළ බදු අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.11,950,907 ක් සහ මුද්දර ගාස්තු රු.7,093,896 ක් ගෙන්වාගෙන නොතිබුණි. | මෙම වර්ෂයේදී මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23(ආ) අනුව සභාවට අයත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය බැහැරලීම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට ලිපි යොමු කර ඇති බව. | කසළ බැහැර කිරීමේදී පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිත කරනු ලබන ට්‍රැක්ටර් ට්‍රේලරයක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතන බව. | වාහනවල අයිතිය නිරවුල් කරගත යුතුය. |
| (ආ) | සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් ඉවත් කිරීමට නිර්දේශ නොකරන ලද එහෙත් දීර්ඝ කාලයක සිට භාවිතයට නොගන්නා ට්‍රැක්ටර් ට්‍රේලරයක් නිෂ්කාර්යව පැවතුණි. | ට්‍රේලර් රථය අලුත්වැඩියා කර කසල එකතු කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | සභාවට අයත් වාහන කඩිනමින් අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂයේදී LDSP ව්‍යාපෘතියෙන් රු. 9,065,413 ක් වැය කර ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය අසළ ඉදිකර තිබුණු හෙළ බොජුන්හල 2022 වර්ෂයේදී සියළු වැඩ නිම කර තිබුණු අතර, ඉදිකර තිබුණු ගොඩනැඟිල්ල කොන්ක්‍රීට් වහලය සහිත බිම් මහලකි. ඉන් අනතුරුව 2023 වර්ෂයේදී සභා අරමුදල් මඟින් එම ගොඩනැඟිල්ලට රු.425,433 ක් වැය කර තිබුණි. කොන්ක්‍රීට් වහලය මත එකතුවන ජලය බැහැර කිරීම සඳහා Sq.m 195.18 ප්‍රමාණය 20 mm ඝණකමට 1:3 මිශ්‍රණයෙන් නැවත කොන්ක්‍රීට් ඇතිරීමට රු.334,636 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. | හෙළ බොජුන්හළ සඳහා දැනට භාවිත කරන ගොඩනැඟිල්ලේ මනා පැවැත්ම සඳහා සභා අරමුදලින් හඳුනාගත් අත්‍යාවශ්‍යම කාර්යයක් ලෙස සළකා මෙම වියදම දරා ඇති බව. | ඉදිකිරීම් නියමිත සැලැස්මක් අනුව සිදුකළ යුතුය. |